රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ :- 04/2010

මගේ අංකය : EST-7/LEAVE/03/3360
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

2010.04.12

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන
සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 36:1:3 වගන්තිය සංශෝධනය කිරීම</u>**

ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 36:1 වගන්තිය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එහි 36:1:3 උප වගන්තිය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට රජය තීරණය කර ඇති බව දන්වමි.

36:1:3 මෙම වගන්තියේ ප්‍රකාර දෙනු ලබන වැටුප් රහිත නිවාඩු කාලය, නිලධාරියාගේ අවුරුදු 20ක් වූ දළ සේවා කාලයට වැඩි වූ කල්හි එසේ වැඩිවූ සේවා කාලය පමණක් වැටුප් රහිත නිවාඩු වෙනුවෙන් හිලව් කොට විශ්‍රාම වැටුප් සඳහා ගණනය කල යුතුය.

නිදසුනක් වශයෙන්, රාජකාරිය සඳහා විදේශයකට පත් කරනු ලැබූ ස්වකීය තනතුරේ ස්ථිර කරන ලද රාජ්‍ය නිලධාරියකුගේ කලත්‍රයාට වසර 28 ක සේවා කාලයක් ඇති විට නිලධාරියා අවුරුදු 10 ක කාලයක් වැටුප් රහිත නිවාඩු ලබා ඇත්නම් විශ්‍රාම වැටුප් හිමිකම සඳහා නිලධාරියාගේ සේවා කාලයට වසර 8ක් ගණනය කල හැකි වන අතර ඉතිරි වසර 2 ඒ සඳහා ගණනය කල නොහැකි වන්නේය.

03. මෙම චක්‍රලේඛයේ විධිවිධාන 2005.11.03 දින සිට බලපැවැත්වේ.

ඩී. දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය